

# දෙවනබස සිංහල - 10 ශ්‍රේණිය



# 11.මිතුරෙකුගෙන් ලිපියක්



11 මිතුරෙකුගෙන් ලිපියක්

නො. 146/50,
ඉහළ වීදිය,
ගමේවෙල,
පස්සර.
2021.08.05

ජය වේවා!

හිතවත් විරාජ්,

මම ගයාන්. මේ ලියුම ලියන්නේ මාස හයකට විතර පස්සෙනේ. ඉතින් විරාජ්, ඔයාලාගේ සැප සනීප කෙසේ ද? අපි නම් සැපෙන් සිටිනවා. ලබන සිකුරාදා අපිට නිවාඩු දෙනවා.

නිවාඩු කාලේ නුවර යමු කියලා අම්මා කිව්වා. අපේ මල්ලී නුවර එන්න හරිම කැමතියි. එයාට ඕන පහළ ඔයේ පීනන්න. මම නම් එන්නේ රඹුටන් කන්න. අපි ආවොත් මේ පාරත් රඹුටන් කඩල දෙනවා නේද? ගිය පාර අපි රඹුටන් මල්ලක් ගෙදරත් ගෙනාවා. මෙහේ දී රඹුටන් කනකොට ඔයාලගෙ වත්ත මතක් වෙනවා.

අපි එන්නේ සතියේ මැද දවසක. මම සෙනසුරාදා දිනවල දෙවන බස (දෙමළ) පාඨමාලාවක් හදාරනවා. ඔයාට තව ටිකක් සිංහල ඉගෙන ගන්න ආසයි කිව්වා නේද? එතන සිංහල භාෂා පාඨමාලාවකුත් තියෙනවා. ඔයාට අයදුම් පතක් තැපැලෙන් ගෙන්වා ගන්න පුළුවන්.

අධ්‍යක්ෂ, භාෂා අංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, බදුල්ල, යන ලිපිනයට ඔයාගෙ ලිපිනය ලියපු, මුද්දර අලවපු ලියුම් කවරයක් සමග ලිපියකින් ඉල්ලීමක් කරන්න.

අපි එනකොට ඔයාට කිතුල් පැණියි, හකුරුයි ගේන්නම්. ඉතින් විරාජ් පවුලේ සියලු දෙනා ම මතක් කළා කියන්න. ඔයාලට බුදු සරණයි!.

මෙයට,<br>
ගයාන්.

- ලිපි ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ.
  1. පෞද්ගලික ලිපි
  2. රාජකාරී ලිපි